**<u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 252-6517 අංක දරණ කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>**

- ඉහත අංක දරණ Mitsubishi L200 4WD Double Cab රථය සඳහා කැබින් බඳ ආනයනය කර සවි කිරීම හා වර්ණ ගැන්වීම ඇතුළු අළුත්වැඩියා කටයුතු වෙනුවෙන් මිල ගණන් කැඳවනු ලැබේ.

- ඔබගේ මිල ගණන් **2024 සැප්තැම්බර් මස 11 වන දින පෙ.ව.10.30**ට පෙර ඉදිරිපත් කරන මෙන් කාරුණිකව දන්වා සිටිමි.

- වැඩිදුර තොරතුරු සඳහා පහත සඳහන් කාර්යාලීය වෙබ් අඩවිය භාවිතා කරන්න.

**ලිපිනය - ලේකම්, ප්‍රාදේශීය සභාව,මාලිම්බඩ,පාලටුව,මාතර.**
**වෙබ් අඩවි ලිපිනය - www.malimbadaps.lk**
**දුරකථන අංකය - කාර්යාලය :- 041-2240208**(ලේකම්/සැපයුම් නිළධාරී)

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුව,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ,
පාලටුව,
මාතර.

- **ඉහත පුවත්පත් දැන්වීමට අදාල තොරතුරු පහත සඳහන් පරිදි වේ.**

**<u>මාලිම්බඩ ප්‍රාදේශීය සභාවේ 252-6517 අංක දරණ කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් මිල ගණන් කැඳවීම.</u>**

1. අදාළ කැබ් රථය පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.
   - කැබ් රථයේ වර්ගය - Mitsubishi L200 4WD Double Cab
   - කැබ් රථයේ පවතින ලියාපදිංචි වර්ණය - Silver
2. ඉහත විස්තර සඳහන් කැබ් රථයට **කැබින් බඳ ආනයනය කර සවිකර වර්ණ ගැන්වීම හා අදාළ අළුත්වැඩියාවන් සිදු කිරීම** සඳහා මිල ගණන් කැඳවනු ලැබේ.
3. මේ සඳහා ඔබගේ මිල ගණන් **2024 සැප්තැම්බර් මස 11** වන දින **පෙ.ව.10.30ට පෙර ලියාපදිංචි තැපැල මගින් හෝ අතින් ගෙනැවිත් ටෙන්ඩර් පෙට්ටියට බහා** ඉදිරිපත් කල යුතුය.

**ලිපිනය - ලේකම්, මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,මාලිම්බඩ,පාලටුව,මාතර.**

**<u>මිල ගණන් එවීමේදී පහත සඳහන් උපදෙස් හා කොන්දේසි සලකා බලනු ලැබේ.</u>**

I. සපයනු ලබන සියලුම අමතර කොටස්, අලුත්වැඩියාව හා පින්තාරුව සඳහා **වසරක වගකීම් කාලයක් අපේක්ෂා කරන අතර ලබාදෙන වගකීම් කාලය** ලංසුපතේ සඳහන් කළ යුතුය.

II. මෙම සම්පූර්ණ අළුත්වැඩියාවට ඉටුකර අවසන් කිරීමට ලබාදිය යුතු කාලය ලංසුපතේ සඳහන් කළ යුතුය.

III. රථයේ අළුත්වැඩියා කළ යුතු සියලු කොටස් ගලවා බැලීමෙන් අනතුරුව තවත් අමතර කොටස් අවශය වෙතොත් ඒ සඳහා මිල ඇස්තමේන්තු ඉදිරිපත් කර පළාත් පාලන ආයතනයේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පමණක් එම අමතර කොටස් සපයා සවි කල හැකිය.

IV. පින්තාරු වැඩ , තහඩු වැඩ, ෆයිබර් අළුත්වැඩියා කිරීම්, පිරිසිදු කාරක, මැලියම්, ප්‍රවාහන ගාස්තු හෝ ශ්‍රමික ගාස්තු සඳහා අමතර මිල ගණන් ඉදිරිපත් නොකල යුතුය.

V. මිල ගණන් වලංගු කාලය තුළ,තෝරාගත් මිල ගණන පිළිගත් බවට අදාළ ලංසුකරු වෙත පළාත් පාලන ආයතනය විසින් දන්වනු ලබන අතර, අලුත්වැඩියාව සම්පූර්ණ කරනු ලබන කාලය තුළ ඉදිරිපත් කර ඇති මිල ගණන වෙනස් නොවන නිශ්චිත මිල ගණනක් (Fixed Value Bid) ලෙස සලකනු ලැබේ.

VI. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සපයා ඇති උපදෙස් අනුව ගිවිසුමක් සකස් කර සේවාව සපයන ආයතනය සමග ගිවිසුම් ගත වනු ඇත.

VII. මෙම අලුත්වැඩියාවට අදාළ වන වගකීම සඳහා ඇපකරයක් ලබාගැනීම, අත්තිකාරම් මුදල් ලබාදීම (Advance Payment),වරින් වර කොටස් ගෙවීම් සිදු කිරීම (Interim Payments/Milestone Payment), ගෙවීම් රඳවා තබා ගැනීම (Retention) හෝ ප්‍රමාද ගාස්තු අය කිරීම ආදිය සිදු කළ හැකි වන්නේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන්

උපදෙස් අනුව පමණි.මේ පිළිබඳව එකඟතාව ගිවිසුමෙහි ඇතුළත් කරනු ඇත.

VIII. සපයනු ලබන බඳ, එම වාහන මාදිලියට අදාළ අංග සම්පූර්ණ බඳක් විය යුතුය. රථයේ වර්ණය වෙනස් නොකරන්නේ නම්, සපයන බඳ රථයේ ලියාපදිංචි වර්ණයෙන් විය යුතුය. නැතහොත් ලියාපදිංචි වර්ණයෙන් පින්තාරු කර සවි කළ යුතුය. **රථයේ වර්ණය Silver පැහැය වේ.**

IX. ඔබගේ මිල ගණන් පිටපත් 02කින් ඉදිරිපත් කරන්න.
මිල ගණන් එවනු ලබන ලියුම් කවරයේ වම්පස ඉහල කෙලවරේ
**කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් මිල ගණන් - පිටපත 01**
**කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් මිල ගණන් - පිටපත 02**
ලෙස සඳහන් කරන්න.

- ලංසුපත් ඉහත සඳහන් පිරිදි පිටපත් දෙකකින් වෙන වෙනම පිළියෙල කර, නැවත එම පිටපත් දෙක එක් කවරයක බහා එහිද වම්පස ඉහල කෙලවරේ "**කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් මිල ගණන්**" යනුවෙන් සඳහන් කරන්න.

X. ඔබගේ ලංසුපත් 2024/09/11 දින පෙ.ව.10.30ට පෙර කාර්යාලයට ගෙනැවිත් ටෙන්ඩර් පෙට්ටියට බහාලීමෙන් හෝ ලියාපදිංචි තැපැල මගින් එවීමෙන් ඉදිරිපත් කල හැකිය.

XI. මිල ගණන් එවීමේදී අප විසින් ඉදිරිපත් කර ඇති ලංසු අයදුම්පතක් භාවිතා කරන්න. මෙම ලංසු අයදුම්පත කාර්යාලීය **වෙබ් අඩවියෙන් හෝ කාර්යාලයට පැමිණ** ලබාගත හැකිය. ලංසු අයදුම්පත සඳහා රු.2000.00ක ආපසු නොගෙවන ලංසු ලේඛන ගාස්තුවක් ගෙවිය යුතුය.

XII. ලංසුපත් 2024/09/11 දින සිට දින 77ක් දක්වා වලංගු විය යුතුය.

XIII. ඉදිරිපත් කරනු ලබන ලංසු සඳහා රු.40000.00ක ආපසු ගෙවන ලංසු සුරක්ෂණයක් මුදලින් හෝ බැංකු සුරක්ෂණයක් මගින් ඉදිරිපත් කල යුතු අතර බැංකු සුරක්ෂණයේ නම ලංසුපතේ සඳහන් නම පරිදි විය යුතුය.

XIV. ද්‍රව්‍ය ණය පදනම මත සැපයිය යුතුය.(ණය කාල සීමාව මාස 01) ඔබගේ ණය කාල සීමාව වෙනස් වන්නේ නම් එම ණය කාල සීමාව පැහැදිලිව සඳහන් කරන්න.

**XV. ප්‍රසම්පාදන කමිටු තීරණය අවසන් තීරණය වේ.**

- වැඩිදුර තොරතුරු සඳහා මෙම දුරකථන අංකය භාවිතා කරන්න.

  **දුරකථන අංකය :- 041-2240208 (ලේකම් හෝ සැපයුම් නිළධාරී)**

  **ලිපිනය - ලේකම්, ප්‍රාදේශීය සභාව,මාලිම්බඩ,පාලටුව,මාතර.**
  **ෆැක්ස් අංකය - 041-2240093**
  **ඊ මේල් ලිපිනය - malimbada.ps@gmail.com**

සභාපති
මාලිම්බඩ ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුව,
මාලිම්බඩ ප්‍රාදේශීය සභාව,
මාලිම්බඩ,
පාලටුව,
මාතර.